කතු වැකිය

සත්‍යය හා සැබෑව පරම මිතුරාත් නෑයාත් වේ

දිවයින

2007 නොවැම්බර් මස 1 වැනිදා බ්‍රහස්පතින්දා

අංක 223, බදුමැන්ඩල් පාර, කොළඹ 13.
දුරකථනය - 2448402, 2497500
ෆැක්ස් - 2344253, 2448103
වෙබ් අඩවිය - www.divaina.com
ඊ මේල් - divaina@unl.upali.lk
දැන්වීම් අංශය - 2436892 (ප්‍රධාන කාර්යාලය)
ෆැක්ස් - 2344252 / 2497543
බෙදාහැරීම් අංශය - 2334566,2330943
ෆැක්ස් - 2334564

අනතුරට පත් ළමයා!

යහපත් ජීවිත ලබා දීම සඳහා යයි කියමින් වැඩි රාජ්‍යයේ ළමයින් 103 දෙනකු රැගෙන ප්‍රංශයට ඇතුළු වීමට උත්සාහ කළ රාජ්‍ය නොවන සංවිධානයක පිරිසක් ප්‍රංශ රජය මඟින් අත්අඩංගුවට ගෙන තිබේ. මේ කුඩා දරුවන් වැඩි රාජ්‍යයේ ළමා නිවාසවල ජීවත් වූ කාත් කවුරුවත් නැති අසරණයෝ වෙති. මෙවැනි ළමයින් වැඩිදෙනා යහපත් ජීවිත ලබා ගැනීමට පිටරටවලට ගොස් ගණිකා නිවාසවල හෝ වහල් කඳවුරුවලදී සිය ආත්මය විනාශ කරනු ලැබීමට ලක් වෙති. වැඩි රාජ්‍යයේ ජනාධිපති කියන්නේ පෙර කී එන්.ජී.ඕ. කණ්ඩායම විසින් මේ දරුවන් පිරිස් පැහැරගෙන ගොස් ඇති බව ය. කුඩා දරුවෝ බොහෝ පහසුවෙන් රැවටිය හැකිය. ඉතා ලස්සන, ඉතා රසවත් දේ ලබාදෙන බවට පොරොන්දු දී ඔවුන් ඕනෑම අපායකට රැගෙන ගිය හැකි ය. තමන් අපායක සිටින බව ඔවුනට තේරුම් යන්නේ ගැලවී ගත නොහැකි තරම් උගුලකට මැදිවී බොහෝ කාලයක් ගිය පසු ය. ලෝකයේ දුප්පත්ම රටවලින් එකක් වන වැඩි වැනි රාජධානි ඒවායේ ජීවත් වන මනුෂ්‍යයන්ගේ නුගත්කම, දුප්පත්කම සහ අසරණ භාවය නිසාම ඕනෑම කෙනෙකුට වංචාවට ලක් කළ හැකි මට්ටමක පවතී. ඉතා හොඳ අරමුණු වෙනුවෙන් යෙදවිය හැකි රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාපාරය ගණිකා වෘත්තියෙහි යොදවන හොරු මෙවැනි දුර්වල රටවල් සොයමින් නිරතුරු සංචාරය කරති. කාමුක සල්ලාල විදේශිකයෝද සමලිංගිකයෝ ද මෙවැනි ප්‍රදේශ කරා ඇදෙන්නේ හිතා ගැනීමට වුව නොහැකි තරම් වේගයෙනි. මෙවැනි නපුරු මිනිසුන් අරාබි නීතියේ එන අංගච්ඡේදන දඬුවම් ක්ෂණිකව ලබා දීමට වැඩිපිළිවෙළක් යෙදීම සත පහකට වැඩක් නැති අනුන්ගේ මළ ඉලව් වෙනුවෙන් කාලය, ශ්‍රමය සහ ධනය වැය කරන එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ආයතනවල යුතුකමය.

කිසියම් රටක ශ්‍රේෂ්ඨත්වය සහ චර්යා සම්පන්න භාවය තක්සේරු කිරීම සඳහා මානයක් ලෙස එම රට සතුන්ට සළකන ආකාරය යොදාගත හැකි බව මහත්මා ගාන්ධි තුමාගේ අදහසකි. සතුන් පසෙකට දමමු. දැන් රටේ සමහර ළමයින් අද සැලකුම් ලබන්නේ සතුන් ලබන සැළකුම්වලටත් පහත් සැළකුම්ය. රත්නපුරේ ළමා සුරැකුම් මධ්‍යස්ථානයකින් ලබාගත් කුඩා පිරිම් ළමයකු අපහරණය කළ කාමාතුරයකු ගැන පසුගියද පුවත්පත්වල පළ විය. එසේම ඒ මෙයට සති කිහිපයකට පෙර 14 හැවිරිදි පිරිම් ළමයකු හෝටල් කාමරයක් තුළ අපහරණය කරමින් සිටි මිනිසකු පොලිසියට හසුවිය. ළමයා අනාථ නිවාසයකින් රැගෙනවිත් ඇත්තේ හද වඩා ගැනීමේ පොරොන්දුව මත යයි කියනු ලැබේ.

දුෂණයෙන් හා අපහරණයෙන් ඝාත්‍රාසයට පත් කෙරුණ දරුවා තමන්ට ලැබුණ ඒ කාලකන්නි අත්දැකීම ප්‍රසිද්ධ කිරීමට බිය වෙයි. ලජ්ජා වෙයි. අපහරණයට ලක්වූ දරුවා තුළ තමන් පහත් යයි සම්මත හැඟීමක් ඇති වෙයි. ඒ හැඟීම විසින් ඔහු පසු ගාමී බවට පත් කරනු ලැබේ. පසු කාලයේ දී ඉතා භයානක මිනීමරුවන්, ස්ත්‍රී දූෂකයන් හෝ සමාජ විරෝධීන් බවට පත් වන්නෝ මෙවැනි දරුවෝ ය. තම ජීවිතයේ කිසියම් සන්ධිස්ථානයක දී සමහරුන් විසින් තමන්ට විශාල අසාධාරණයක් කරන ලද්දේ ය යන හැඟීම ඔහු තුළ හට ගන්නේ ය. ඔහු පෙරළා සමාජයට පාඩම් උගන්වන්න ට යයි. අන්තිමේ දී සමාජය ආපසු හැරී ඔහුට පාඩම් උගන්වන අතර ඔහුගේ මළ සිරුර කාණුවක තිබී හමුවේ යි.

ශ්‍රී ලංකාවේ සමාජ තත්ත්වය ඉතා වේගයෙන් පිරිහෙමින් පවතී. ගංජා ප්‍රවර්ධනය කරන ගීත දැන් ගායනා කෙරේ. ඒ ගැන ප්‍රශ්න කරන විට "බොබ් මාලි" නමැති සුප්‍රකට අප්‍රිකානු ජනතාවාදී ගායකයාද ගංජා භාවිත කළ බව නිදහසට කාරණා වශයෙන් කියනු අසන්නට ලැබේ. අප්‍රිකාවේ බොබ් මාලිගේ සංස්කෘතිය එකක් වන අතර ආසියාතික අපගේ සංස්කෘතිය තවෙකකි. බොබ් මාලිගේ සංස්කෘතිය තුළ ගංජා තිබුණද අපගේ සංස්කෘතිය තුළ එය නැත. ඒ සංස්කෘතික ගැටීම තවදුරටත් තිබුණොත් කිසියම් දවසක සල්ලාල විදේශිකයන් කල්පනා කරනු ඇත්තේ අපහරණය සඳහා මීළඟ ළමයින් තොගය ගෙන ඒම වැඩි රාජ්‍යයට නොව ශ්‍රී ලංකාවට යෑම සුදුසු බව ය.

ළමා නිවාස ගණිකා නිවාස වීම ගැන අපි තරයේ විරුද්ධ වෙමු. තත්ත්වය මෙසේ නම් වෛද්‍ය පරීක්ෂණ සඳහා ළමයින් පණ පිටින් කපා බැලීම ළඟදීම ශ්‍රී ලංකාවේදී පටන් ගන්නවා ඇත.

පෙඩරල් ව්‍යාපාරය

මෙත්තානන්ද

අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහනයට ලක්ව සිටි සිංහල බෞද්ධ ජනතාවගේ ඓතිහාසිකම් යළි දිනා ගැනීම සඳහා අවංක ලෙසත්, නිර්භයවත් නිස්සරණාධ්‍යාශයෙන් කටයුතු කළ එල්.එච්. මෙත්තානන්ද මහතා දැයෙන් සමුගෙන අදට (නොවැම්බර් 01ට) වසර 40 ක් සම්පූර්ණ වේ. සිංහල භාෂාව පමණක් රාජ්‍ය භාෂාව කිරීම සඳහන් බෞද්ධාගම රාජ්‍ය ආගම කිරීම සඳහන් ගෙන ගිය සටන් වල ප්‍රමුඛ නායකයකු වන එතුමා එම සටන් වලට නායකත්වය දුන්නේ කුමන පදනමක සිට ද යන්න අද බොහෝ දෙනා නොදන්නා කාරණයකි. එමෙන්ම අදද විවේචනයට ලක්වන ක්‍රියාමාර්ගයන්ය. එබැවින් එතුමාගේ ගුණ සැමරීම සඳහන්, නොයෙකුත් විවේචනයන්ට ලක්ව තිබෙන එතුමා නායකත්වය දුන් සටන් වල සැබෑ අරමුණ පැහැදිලි කිරීම සඳහන් මෙම ලිපිය පලකරනු ලැබේ. මෙම ලිපිය පසු ගිය චර්ෂයේ ප්‍රකාශයට පත්කරන ලද ජාතික සටනට පණදුන් මෙත්තානන්ද ලිපි කෘතියෙන් උපුටා ගන්නා ලදී.

ලංකාවේ වැඩි ජනතාව ලංකාවේ දෙවැනි පෙළේ පුරවැසියන් හැටියටත්, සුළු ජනතාව පළමුවැනි පෙළේ පුරවැසියන් හැටියටත් සැලකීමද, වැඩි ජනතාවට වෙනස්කම් කරමින් වරප්‍රසාද ලත් සුළු ජනතාවට වාසි වන පිළිවෙලට සැලකීමද මේ දිවයිනට සිදු වී ඇති බලවත්ම විපතය. යටත් විජිත පාලකයන් විසින් අපට ඉතිරිකොට ගිය දයාදයන්ගෙන් එකක් තමා මේ අසාධාරණත්වය.

මේ මහා විපත එක්සත් ජාතීන්ගේ සන්දේශයකින් විස්තර කරදී තිබෙන්නේ මෙසේය.

"සාමාන්‍යයෙන් වෙනස්කම් විදින්නේ, වෙනස්කම් කරන සමූහය හා සසඳන ගණනින් අඩුවිටා සුළු ජනතාවය. එහෙත් ස්වාධිපත්‍යය පතුරුවා සිටින සුළු ජනතාව කරන වෙනස්කම්වලට වැඩි ජනතාව භාජනය වන අවස්ථා ද ඇතිවන්නට පුළුවනි. ඒ මතුද නොවේ. එවැනි අවස්ථා ඇත්ත වශයෙන් ඇති වී තිබේ. යටත් විජිත ආධිපත්‍යය හෝ යටත් විජිත චාරිත්‍ර විධි හෝ ප්‍රචලිතව පවත්නා රටවල මෙවැනි අවස්ථා උද්ගත වන්නට පුළුවනැ." The main types and Causes of discrimination නමැති ග්‍රන්ථයේ 29 වැනි පිටුවෙන් උපුටා සිංහලයට පරිවර්තනය කිරීමෙනි)

ලංකාව නිදහස ලබා අවුරුදු දෙළහක් ගත වී තිබේ. එහෙත් ලංකාවේ පාලන පදනම, ආර්ථික පදනම සහ සංස්කෘතික රටාව තවම පවතින්නේ යටත් විජිත ක්‍රමයටයි. මේ රටාව වෙනස් කිරීම සඳහා ඉංග්‍රීසි අධ්‍යාපන මාධ්‍යය වෙනුවට සිංහල අධ්‍යාපන මාධ්‍යය යෙදීමටද, ජාතික අධ්‍යාපන ක්‍රමයක් බිහිකොට දක්ෂ ගම්බද දරුවන්ට විද්‍යාත්මක සහ කාර්මික අධ්‍යාපනය දීමටද යනාදී විසින් ගන්නා ලද හැම තැනකටම සංවිධානාත්මකව විරෝධය ප්‍රකාශ කරනු ලැබිය.

විදේශික ගැතිකමින් මිදීම් වස් මේ දිවයින විසින් ඇත්ත වශයෙන් ගන්නා ලද එක් පියවරක් නම්, සියයට හැත්තෑ නවයකුත් දශම දෙකක් වන සිංහලයන් විසින් කථා කරන භාෂාව, ලංකාවේ රාජ්‍ය භාෂාව හැටියට අභිෂේක කිරීමයි. නමුත් විමුක්තියේ ජය කෙහෙළි නැංවීමටත් පෙර, ඒ ස්වාධීන මහා ඉදිරි ගමන නැවැත්වීම සඳහා සියයට දෙළහයි දශම අටක් වන ලංකා දෙමළ වෙනුවෙන් පළමුවෙන්ම දෙමළ බිහොප්තුමෙක් සමනැන් හඬ යාඥාවට නැඟුවා.

1958 ඔක්තෝබර් 22 වැනිදා චාස් එච්. වික්‍රමනායක දේවගැතිතුමා "ක්‍රිස්තියානි පූජකයෙකුට බෞද්ධ මතය පෙනෙන හැටි" යන ශීර්ෂ පාඨයෙන් යුත් පත්‍රිකාවක් නිකුත් කරමින් මෙසේ ප්‍රකාශය කළේය.

"ඔවුන් (බෞද්ධයන්) කල්පනා කරන්නේ භාෂා ප්‍රශ්නය ක්‍රිස්තියානි පල්ලිය විසින් බිහිකරන ලද්දක් කියායි. 'දෙමළ භාෂාව අන්තරාවේ' යන හඬ දේශපාලනඥයන් විසින් නැඟීමට බොහෝ කලකට පෙර යාපනයේ දෙවියන්ගේ පල්ලියේ බිෂොප්වරයෙකු විසින් එම හඬ නගනු ලැබිය යි කියති. ඒ අතර , මේ පාඨය මහ මෝඩකමක් හැටියට ඉන්දියාවේ මෑතන් නමැති නෝනා මහත්මියක් විසින් හඳුන්වන ලද නමුත් මේ ප්‍රතිපත්තිය දිගටම ගෙනගියේ යයි යාපනයේ ක්‍රිස්තියානි පල්ලිය චෝදනා ලබයි.

පෙඩරල් පක්ෂය සමනැන් හඬ, ගාල ගෝට්ටියක් බවට පත් කරවමින් 1956 දී තිරිකුණාමලයේ පවත්වන ලද සම්මේලනයේ දී තීරණය කළේ 'ස්වතන්ත්‍ර දෙමළ භාෂා රාජ්‍යයක් පිහිටුවීමට' ය. 'දෙමළ කථා කරන ජනයාට තමන් ද ඉන්නා බව පෙන්වීමට හැකිවන්නේත්, පාරම්පරික නිජබිම උල්ලංඝනය කිරීමෙන් ආරක්ෂා කරගත හැක්කේත් ඒ ආකාරයෙන් පමණකි' යි ද ඔවුහු එහිදී තීරණය කළහ.

ඒ තීරණය අනුව පෙඩරල් පක්ෂය කළේ තිරිකුණාමලයේ නාවික හමුදා මූලස්ථානයේ අනාගතය ගැන කිසි තීරණයකට එළඹීමට පෙර දෙමළ කථා කරන මිනිසුන් සමඟ සාකච්ඡා කොට ඔවුන්ගේ කැමැත්ත ලබාගත යුතුයයි පවසා එවකට එංගලන්තයේ අගමැති බුරය දරු ඇන්තනී ඊඩන් මහතාට කේබලයක් යැවීමය.

(ට්‍රයිම් -1956.6.28)

ඒ එක්කම ඔවුහු ලංකාණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තියට විරුද්ධ වූ දකුණු ඉන්දියානු දෙමළුන්ගේ ආධාරය ලබාගන්නා අටියෙන් දකුණු ඉන්දියාවේ රැස්වීම් සංවිධානය කළහ.

දිවංගත බණ්ඩාරනායක මහතා යුහුසුළු කරවීමෙන් 1957 දී බණ්ඩාරනායක - චෙල්වනායකම් ගිවිසුම ඇතිකරනු ලැබිය. මෙය තමන් පාවාදීමක් හැටියට පෙන්වා දුන් මහජනතාව - එතුමා බලයට පත්කළ මහජනතාව - ඒ ගිවිසුම හෙළා දුටුහ.

1957 දී මඩකලපුවේ පැවැත් වූ පෙඩරල් සම්මේලනයේ දී බණ් - චෙල් ගිවිසුමට පක්ෂව කථා කළ ඇස්.ඇම්. රාසමාණික්කම් මහතා මෙසේ ප්‍රකාශය කර සිටියේය.

"අපේ සටන ඉදිරියටම ගෙනයනවා. අපේ සියලුම ඉල්ලීම් ලැබෙන තුරු අපි සටන් කරන්නෙමු. මේ වනහි (ගිවිසුම වනාහි) අපේ මීළඟ පියවර ගැනීමට අපට පාදක වන පදනමයි"

('සිලෝන් ඩේලි නිවුස්' - 1957.7.29)

මින් අදහස් වන්නේ උතුරු නැගෙනහිර ජනපද යෝජනා ක්‍රම, දහස් ගණනින් ලංකාවට හොරෙන් පැමිණෙන්නන්ගේ පෝෂණාගාර වීමයි. සිංහලයන් අන්තිමට අභිබවනය කිරීමේ පාදක හැටියට ජනපද උපයෝගී කරගැනීමයි.

නිශ්චය වශයෙන්ම මින් අදහස් කෙරෙන්නේ ලංකාවේ ඉතිහාසය සහ පිහිටීම වෙනස් කිරීම් වස් මහා ප්‍රයත්නයක් දරීමයි.

බ්‍රිතාන්‍යයන් ලංකාවෙන් පන්නා ගැනීමට සිංහලයෝ 1816 දී සහ 1848 දී විමුක්ති සටන් දෙකක යෙදුණහ. ඒ හැම අවස්ථාවක දී ම සිංහලයා බෙල්ජියානුවන් අත සිටින කොංගෝ වැසියකු බවට පත්විය. 1818 විමුක්ති සංග්‍රාමයෙන් පසු උතුරු නැගෙනහිර මූදුකරයෙන් සිංහලයා පිටුවම් කරන ලදී. එතැන මලබාරුන්ට (දෙමළුන්ට) දෙන ලදී. ඔවුන් නම්මවා ගැනීම ලෙහෙසි වූ බැවිනි. (ජෝර්ජ් ඇම්. ෆෝල්ර් සහ නෙවිල්)

එහෙත් ආණ්ඩුව දෙමළ භාෂාවේ හිමිකම්වලට මුහුණදීම් වස් දෙමළ භාෂා (විශේෂ විධි විධානව) පනත කෙටුම්පත් කළේය. ඉන් පහත සඳහන් පරිදි විධි විධාන සැලසී තිබේ.

1. බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා දෙමළ ශිෂ්‍යයන්ට දෙමළ මාධ්‍යයෙන් ඉගැන්වීම්.

2. දෙමළුන් දෙමළ භාෂා මාධ්‍යයෙන් රජයේ සේවයට ඇතුළු කරවීම.

3. කාර්යාලයීය ලිපි ගනුදෙනු වලදී දෙමළ භාෂාව

එල්. එච්. මෙත්තානන්ද

පාවිච්චි කිරීම.

4. නියමිත පාලන කාර්යයන් සඳහා උතුරේ සහ නැගෙනහිර පලාත්වල දෙමළ භාෂාව භාවිත කිරීම

නීතියෙන් සම්මත වූ මේ විධි විධානයන්ගෙන් සෑහීමකට පත්නොවූ පෙඩරල් පක්ෂය උතුරු නැගෙනහිර පලාත්වල පාලනය ඇනහිටීමේ අධ්‍යාශයෙන් කච්චේරි සහ අනෙකුත් රජයේ ආයතන වැටලීම පිණිසම ව්‍යාපාරයක් අරඹා තිබේ.

මේ ව්‍යාපාරයේදීත් එදා කළාක් මෙන් පෙඩරල් පක්ෂය, රට දෙකට බෙදීමේ 'සමනැන' ගාලගෝට්ටියෙන් රට මුළා කරවන නව ලංකා සම සමාජ පක්ෂයත් සමඟ අත්වැල් බැඳගත්තේය.

1956 දී නව ලංකා සම සමාජය විසින් පාලික ඒ. ඩී. ඇස්.ඩබ්.ව. බම්බලපිටියේ හින්දු විද්‍යාලයේ දී රැස්වීමක් පවත්වා ආණ්ඩුව අමාරු තත්ත්වයකට හෙළමින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් යෝජනාවක් සම්මත කළාය. හරියටම මේ යෝජනාව සම්මත කළේ තිරිකුණාමලයට ගිය පෙඩරල් පෙළපාලියත් සමඟ එකම වකවානුවෙහිය.

1958 අප්‍රියෙල් මාසයේ දී පැවැත් වූ ශ්‍රී විරෝධී ව්‍යාපාරය ලත් තැනම ලොප් විය. එවිට පෙඩරල් පක්ෂය කළේ නව ලංකාකාරයන් සමඟ එකතු වී ඔවුන්ගේ අනුගාමික රජයේ සේවකයන් ලවා හදිසියේම වැඩ වර්ජනයක් ඇති කිරීමයි. අයිතිවාසිකම් ලබාගැනීමේ මුහුණුවරින් කරන ලද මේ වැඩ වර්ජනයේ පරමාර්ථය වූයේ ආණ්ඩුව පෙරළීමය.

සිංහල නිලධාරීහු රාශියකටම රාජකාරි වැඩට නොගොස් සිටීමට සිදුවිය. ඊට හේතුව කුමක්ද? කොහොමද මහත්මයා අපි වැඩට යන්නේ අපේ ප්‍රධානියෝ පෙඩරල්ලු. ස්ට්‍රයිකයට සම්බන්ධ නොවුණොත් ඔවුහු අපට තර්ජනය කරනවා. හිරිහැර කරනවා. අපි බයෙන්ම වැඩට යන්නේ නෑ. පෙඩරල්ලු වැදී සිටින ලංකා සිවිල් සේවක වෘත්තීය සමිතියේ ආධාරයද අඩුවක් නැතිව මේ වැඩ වර්ජනයට ලැබුණි. ඔවුන් තීරණය කළේ 'අපි සාමාන්‍යයෙන් නොකරන වැඩ අපි කරන්නේ නෑ' යනුවෙනි. ලංකා වෘත්තීය සමිති සම්මේලනය, ප්‍රජාතන්ත්‍ර කම්කරු සම්මේලනය ලංකා කම්කරු සම්මේලනය, ලංකා වෙළඳ සේවක සංගමය යන වෘත්තීය සමිතිවලද ආධාරය ඊට ලැබුණි.

නමුත් ආණ්ඩුවේ සේවකයන්ගේ ඒ වැඩ වර්ජනය පුස්ස බින්ද හා සමාන විය. එතකුදු වුවත් 1958 මැයි දින රැළියේ දී නව ලංකාකාරයෝ ඉදිරිපත් කළ සටන් පාඨ දෙකක් මෙසේය.

'සිංහල හා දෙමළ රාජ්‍ය භාෂා කරවනු'

'වතු කම්කරුවන්ට පුරවැසිභාව දෙනු.'

මින් ඇති වූ නොසන්සුන්කම 1958 කලබලවලට තුඩු දුන්නේය. එහි විපාක භයානක විය.

තව තවත්, නව ලංකාකාරයෝ 'සමතැන' බෙරයම ගැසූහ. 1958.11.29 වැනි දින පත්තරවලට ලිපියක් ලියූ නව ලේකම්,



01.11.2007